2000 04 26

## පූජිත චරිත

# බුදු සසුනට අමිල සේවයක් කළ එල්. එච්. මෙත්තානන්ද

දෙස බස රැස සිය ඇස මෙන් සලකමින් සිය මුළු ජීවිතය පුරා අමිල මෙහෙවරක් ඉටුකර කාලයේ වැලිතලාවෙන් අද වැසී ගොස් සිටින එදා බෞද්ධ බලවේගයේ සෙන්පතියකු වූ දකුණු ලක බලපිටියේ ඇල්.එච්. මෙත්තානන්ද ගුරු දේවයාණන්ගේ හඬ අද අපි අවදි කරමු.

සිංහල සංස්කෘතියත් බෞද්ධ ආගමත් රෙද්ද බැතියමත් ගුරුකමත් යටත් විජිතවාදීන් විසින් පාගා ගෙන සිටි දහනව වන සියවසේ අවසාන දශකයේ දී අම්බලන්ගොඩ කවුඩුවාමුල්ලේ දී 1894 මාර්තු 19 වන දින හිරු එළියට පළමුවන ජීවන සුවඳ මේ සිහිනි දරුවා මුසු කළේය. අනාගතයේ දස දෙස කිතු ගොස නගන්නට පෙරුම්පිරූ ඒ දරුවා ලොකු සාත්තු සේවා මෙත්තානන්ද නම් විය.

අති කීර්තිමත් අම්බලන්ගොඩ ධර්මාශෝක විදුහලෙන් ද ගාල්ලේ රිච්මන්ඩ් විදුහලෙන් ද සතර හැදෑරූ මෙත්තානන්ද තරුණයා මහරගම ගුරු විදුහල ඔස්සේ ගුරු වෘත්තියට පිවිසියේ ය. 1924 දී ඔහු විවාහ විය. 1932 දී කොළඹ ආනන්ද විදුහලේ වැඩ බලන විදුහල්පති ධූරයට පත්ව තුරුණු වියේ පටන් ඇප කැප වූ සිංහල බෞද්ධ හඬ අවදි කරන්නට ආනන්දය ඔහු වේදිකාව කර ගත්තේය. සිංහල බෞද්ධ ප්‍රබෝධය ගොඩ ගැනීමට ඔහු ආනන්දයේ දී තිර අදිටන් කර ගත්තේ ය. 1936 දී මහනුවර ධර්මරාජ විදුහල්හි විදුහල්පතිධූරයට පත්ව යළිත් දෙවසරකින් ආනන්දයේ ආනන්ද ජනක බෞද්ධ පුසබිම ගොඩ නගන්නට පැමිණියේ ය. ආනන්දයේත් ධර්මරාජයේත් අද ලබා ඇති පුළුල් ප්‍රගතියෙහි පුරෝගාමී මෙහෙවර කරන ලද්දේ මෙත්තානාන්ද ගුරු දේවයාණන්ය. මෙත්තානන්ද මහතාගේ කාර්යශීලීත්වය හා මනා පාලනය කෙතරම් ජනප්‍රියද යත් විශ්‍රාම යන තෙක්ම ඔහු එම පදවියෙහි බැබලුනේ ය.

ඉංග්‍රීසි යටත්විජිතය ඉදිරියේ අධිරාජ්‍යවාදී නිලධාරීන් හමුවේ ඉතා දීන ලෙස තාන්න මාන්න ලබා ගැනීමට බහුතරය පෙළඹෙද්දී මෙත්තානන්ද මහතා අව්‍යාජ අවංක රුහුණු පුත්‍රයෙකු ලෙස ස්වජාතිය ආගම දේශය රැක ගැනීමේ විරෝධාර සටනට නොබියව උර දුන්නේය. ආධාර ලබන සියළුම පාසල් රජයට පවරා ගත යුතු යැයි පළමුවෙන්ම ප්‍රබල හඬක් නැගුවේ මෙත්තානන්ද වීරවරයාණන් ය. කතෝලික පල්ලිය ප්‍රධාන යටත්විජිත චින්තනයෙන් පිම්බුනු දේශීය ධනපති පන්තියේ නියෝජිතවරු මෙත්තානන්ද මහතාට නිර්දය ලෙස දිගට හරහට පහර දුන්හ. ඉන් වඩාත් පන්නරය ගත් ඔහු බෞද්ධ ජනතාවගේ සාධාරණ අයිතිවාසිකම් ලබාදීමටත් ප්‍රබල බෞද්ධ ජන හඬක් ගොඩ නැඟීමටත් ආත්ම පරිත්‍යාගයෙන් සටන් බිමට පිවිසියේ ය.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මගින් 1954 දී පිහිටුවන ලද බෞද්ධ කොමිෂන් සභාවේ නියෝජිතයෙකු ලෙස ඒ මහතා පොදු වේදිකාවට නැග බෞද්ධ අයිතීන් දිනා ගැනීමට අභීතව සිංහ නාද කළේය. බෞද්ධ අධ්‍යාපනයට නව පණක්දීම රටේ ජනතාව තුළ සදාචාරසම්පන්න බවක් ගොඩ ගැනීම ජාත්‍යානුරාගය හා දේශාභිමානී චින්තනයක් උදෙසා ජනතාව දැනුවත් කිරීම අදහස් ඉෂ්ට සිද්ධ කර ගැනීම එතුමාගේ පළමුවන අදහස විය. බෞද්ධ අධ්‍යාපනය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අරමුණ උදෙසා ත්‍රිපිටකය සිංහල භාෂාවෙන් මුද්‍රණය කර බෙදා හැරීමට සම්මේලනයේ සභාපති මෙත්තානන්ද මහතා කරන ලද වෑයම ඉටුවූයේ මන්දගාමී පිළිවෙත් මතය. සිංහල රාජ්‍ය භාෂාව කිරීමේ විරෝධාර සටනේ මුල් පෙළේ නායකයෙකු වූ මෙත්තානාන්ද මහතා 1956 සිදු වූ සමාජ සංස්කෘතික ආර්ථික හා දේශපාලන අරගලයේ තීරණාත්මක සාධකයෙක් වෙමින් පෙරමුණ ඇනිය ගොඩ නැගීය. මෙත්තානන්ද මහතාගේ ගජ මිතුරා වූයේ පනස්හයේ අරගලයේ සූක්ෂ්මතම මෙහෙයවූ පිලිප් ගුණවර්ධනයන්ය. පෙරමුණ හා බෞද්ධ බලවේලය නමැති කාලීන පුවත්පත් මගින් පොදු ජනතාවට අවශ්‍ය දැනුම ලබා දුන්නේය. පළමුවරට සංස්කෘතික දෙපාර්තමේන්තුවක් ගොඩ නැගුණේද මෙත්තානන්ද මහතා බඳු දේශප්‍රේමීන්ගේ අප්‍රතිහත සටන්මාලාව තුළින් බව අද බහුතරයට අමතකව ඇත. 1962 දී සියළුම ආධාර ලබන පාසල් විදුහල් රජයට පවරා ගත යුතුයැයි ප්‍රබල ජනමතයක් ගොඩ නැගිණි. අදෘශ්‍යමාන බලවේලයත් රාශියක් නිරන්තරව බාධක ඉදිරිපත් කරමින් වැඩ කඩොළු ගොඩ නගද්දී ආධාර ලබන පාසල් විදුහල් රජයට පැවරිණි. මෙත්තානන්ද මහතා තරම් ඒ පනත ක්‍රියාත්මකවීමෙන් උද්දමයට පත් වෙනත් කිසිවෙකු අපි නුදුටිමු. මහාචාර්ය ගුණපාල මලලසේකර, අධ්‍යාපන විශාරද ගත්කතුවර පී.ද. එස්. කුලරත්න, ගුරු නායක දේ පීටර් සිල්වා ආදී සමකාලීනයන් සමඟ අපේ දේශයේ බෞද්ධ අධ්‍යාපනයට නවාලෝකයක් ලබා දීමට මුළුමහත් ජීවිතයම ගතකළ මෙත්තානන්ද මහතා වැනි දුර්ලභ ගණයේ සත්පුරුෂයින් යළි අපේ මහපොළව මත ජනිතවේදැයි විශ්වාස කළ නොහේ.

මුදල මත හඹා යන තිරශ්චීන වත්මන් සමාජ තලයේ දරුවන්ට යහමග පෙන්වන ගුරුවරුන් පවා යාන්ත්‍රිකකරණයට හසුව කරනු ලබන විගඩම් ගැන මෙනෙහි කරන කල්හි මෙත්තානන්ද මහතා බඳු ධීරවීර සත්පුරුෂයින්ගේ අවශ්‍යතාවය මෙතෙකැයි කිව නොහේ. මෙත්තානන්ද මහතා බඳු ගුරුපියවරුන්ට එදා තිබුණේ එකම එක ජීවිතයකි. ඒ ගුරු ජීවිතයයි. යටත් විජිතවාදය විසින් ලංකාව ඇතුළු ආසියාවේ රාජ්‍යයන් කරන ලද අයුතු අසාධාරණ තුච්ජ ක්‍රියාකලාපය නිසා උරණව සිටි මෙත්තානන්ද මහතාට එංගලන්තයේදී සිය බුද්ධි මහිමයෙන් හිමිකර ගත් ශාස්ත්‍රපති උපාධිය ද නොලැබුණු බව බොහෝ දෙනා නොදනිති. හින්දි භාෂාව ගැන ඔහු තුළ පුළුල් දැනුමක් තිබුණි. එසේම ඔහු ඉන්දියානු සංස්කෘතියට බෙහෙවින් ආදරය කළේ ය. ශ්‍රී නේරුතුමාට උත්තමාචාරයෙන් ගෞරව කළේය. ආනන්දයේ ආදි කර්තෘ දිනය යෙදෙන්නේ නොවැම්බර් 1 දිනට ය. 1948 නොවැම්බර් 1 දින ආනන්දයේ විදුහල්පතිධූරයට මෙත්තානන්ද මහතා පත් වූ අතර එවැනිම දිනක 1967 නොවැම්බර් 1 දින සිංහලකමට රෙද්දට බැතියමට ගමට ගමේකටම ආදරය කළ මෙත්තානන්ද ගුරු දේවයාණන් දෙනෙත් පියා ගත්තේ සමාජ අසාධාරණය තවදුරටත් විඳවන්නට අකමැති වූ නිසාදැයි අපට සැක සිතේ.

**බන්දුල ආර්. ගුලවත්ත**